2020 වසරේ ශ්‍රී ලංකාවේ සිදුවී ඇතැයි වාර්තා වී ඇති දිවි තොර කරගැනීම් ප්‍රමාණය 3,074 කි. එනම් දිනකට දිවි තොර කරගැනීම් 8 කටත් වැඩි සාමාන්‍යයකි. මේ අතරින් ඝාතන-දිවි තොර කරගැනීම් සිදුවීම් සඳහා සාපේක්ෂව වඩාත් ඉහළ අවධානයක් ලැබෙනා බව දක්නට ලැබේ. එවැනි සිදුවීම් වාර්තාකරණයේදීද දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී පිළිපැදිය යුතු මාධ්‍ය ආචාර ධර්මයන්ට විශේෂ අවධානයක් ලබාදිය යුත්තේ ඒ හෙයිනි.

උදාහරණ ලෙසින් ඝාතන-දිවි තොර කරගැනීමේ සිදුවීමක් මව්බිම පුවත්පත (09/12) තුළ වාර්තා කෙරී ඇති ආකාරය ගත හැක. මෙම පුවත් වාර්තාව සම්බන්ධව අපගේ නිරීක්ෂණයන් මෙසේ පෙළගස්වමු.

1) ඝාතන-දිවි තොර කරගැනීමේ සිදුවීම මුල් පිටුවේ පළ කර ඇත. මෙවැනි සිදුවීම් ප්‍රමුඛතාවයකින් යුතුව පළ නොකරන මෙන් මාධ්‍ය ආචාර ධර්ම ඔස්සේ දැක්වේ. මන්දයත්, අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා එවැනි පුවත් පෙළඹවීම් විය හැකි බැවිනි.

2) මෙවැනි පුවත් වාර්තාවන් හා හදිසි උපකාරක අංකයන් පළ කිරීම අවශ්‍ය වේ. මන්දයත්, ඒ ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකුගේ ජීවිතය බේරා ගැනීමට ඉඩක් ඇති බැවිනි.

3) එසේම දිවි තොර කරගැනීමක් භාවාතිෂය ලෙසින් දැක්වීමෙන් වැළකිය යුතු බවද මාධ්‍ය ආචාර ධර්මයන් තුළින් අවධාරණය වේ. මෙම පුවත් වාර්තාව තුළ දිගින් දිගටම ඝාතනය කෙරුණු බවට සැක කෙරෙන කාන්තාවගේ බාහිර ස්වරූපය "රූමත්" යන විශේෂණය ඔස්සේ දක්වා තිබේ. එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් සිදුවන කොන් කිරීමකි.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://www.police.lk/.../04.Mode-of-suicides---for-Year...

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima**